නොගැටෙන තරම් දුරින්, කිසිවකුගේ අනුකම්පාවට ලක් නොවන තරම් ඈත කෙළවර පිහිටි පැල්පතේ සිටින අසරණ මහල්ලා පිළිබඳ පාඨක සිත් තුළ අවධානයක් සමග අනුකම්පාවක් ද මතු කර ලමින් මෙම පද පෙළ රචනා වී ඇත.

තනි වූ බැල්ල, සොබා දහමේ දැඩි පහරින් ද බැටකමින්, ගාටගාටා ඇවිත් නවතින්නේ, තමන් ඉවෙන් මෙන් දැනගත් පරිදි, කිසියම් පිළිසරණක් ඇති තැනකය.

"තෙමී හෙම්බත් බැල්ල ඇවිදින්
නතර වී පැල්පතේ දොර කඩ
ඔලුව ඇතුළට රිංගවා ගෙන
සිහින් හඬකින් කෙඳිරි ගෑවා"

යන්තමින් හෝ දයාවක් ඉතිරි වී තිබූ තැන නැවතුණ බැල්ල තම දුබල මුවෙන් නැගූ කෙඳිරිලි හඬ අසරණ බව ධ්වනිත කර ලන්නකි. එම සිහින්, දුබල හඬ මෙතෙක් හුදෙකලා වී, පාළුවෙන් මිරිකී සිටි මහල්ලාට සුරලොවින් ගෙන ආ සුබ පණිවිඩයක හඬක් වැන්න. මිනිස් කටහඬක් තබා අන් කිසිදු ශබ්දයක් නොඇසී, සිටි මහල්ලාට ඒ හඬ සිතට සැනසුමක් ගෙන දෙවයි.

"මහල්ලා දොරටුවට පැමිණී
කබල් දොර ඇරලා බලන විට
තෙමී දියබත් කැහැටු බැල්ලගෙ
දෙනෙත් හමු විය ඔහුගෙ දෙනෙතට"

අනුකම්පාවෙන් පරිපීඩිතව පිහිටක් පතා පැමිණි අසරණ බැල්ල සිහින් හඬින් කළ දුක්බර ආයාචනය සමග බැල්ලගේ දුබල නෙත් මහල්ලාගේ නෙත් හා ගැටීමෙන් ආදරයක බිංදු මාත්‍රයක් දෙදෙනාටම දැනෙන ආකාරයක් කවියා මෙයින් මතු කර ඇත. නෙතට නෙත හමු වීමෙන් දෙදෙනාගේම අසරණ බව හඳුනාගැනීමත් සමගම පැල්පත තුළට ඇතුල් වන්නට බැල්ලට ඉඩ ලැබෙන ආකාරය ද සංවේදී ලෙස ඉදිරිපත් කිරීමට මානික්කආරච්චි කවියා යොමු වී ඇත.

"බැල්ල කෙඳිරි ගා නගුට වනාපී
හිස ඔසවා යළි මුහුණ බලාපී
ටික ටික පැල්පත ඇතුළට ආපී
මහල්ලාගෙ දෙපයම ලෙව කාපී"

සත්ව ලෝකය තුළ පවා ආදරය, සෙනෙහස අනුකම්පාව හඳුනාගැනීමේ ශක්තියක් ඇති බව ප්‍රකට කරවමින් මෙම හමුව සිත්ගන්නා පරිද්දෙන් ඉදිරිපත් කිරීමට කවියාගේ කවිත්වය හේතු වී ඇත. සිහින් කෙඳිරිලි හඬින් මහල්ලාගේ පිළිසරණ පතන බැල්ල ඔහු තමන් එළවා දමනු වෙනුවට නිහඬව සිටීමෙන් තමාට ඔහුගේ සෙවණ ලැබෙන බව ඉවෙන් මෙන් දැනගනියි. මිනිස් ලොව තුළ බොහෝ විට කළගුණ නො-දන්නවුන්ගේ හැසිරීම් ගැන සිතන විට සුනඛයන් අතර බොහෝ විට කෘතගුණ පළ කිරීමේ මහඟු ලක්ෂණ පවතින බව අපි අත්දැකීමෙන්ම දනිමු. නිහඬව සිටිමින් වුව, දෙනෙත්වල බැල්මෙන් තමන්ට පිළිසරණක් ලැබෙන බව දැන පැල්පත තුළට පිවිසෙන බැල්ල මුලින්ම කරනුයේ මහල්ලාගේ දෙපා ලෙවකෑමය.

මෙතෙක් හුදෙකලාවේ ගැඹුරු පත්ලටම කිමිදී සිටි මහල්ලාට බැල්ලගේ ක්‍රියාව සමග උගේ දිවෙහි උණුසුම් ස්පර්ශය මහා පිහිටක්, ආදරයක්, සෙනෙහසක් මෙන් දැනෙයි.

"බැල්ලගේ දිවේ සිසිලෙන්
වෙරසුන් දෙපා තෙත් විය
ඇතුළතින් වට වැස්සෙන්
දෙනෙත් කෙවෙනි ද තෙත් විය"

දක්ෂ කවියකුට යොදාගත හැකි උපමා, රූපක වැනි යෙදුම්, ඖචිත්‍යයෙන් යුතුව යොදාගනිමින් කවියා මෙහිදී රසික සිත් තුළ චමත්කාරයක් දැනවෙන සේ සිය නිර්මාණය නිමා කොට ඇත. මහල්ලා සතු වෙර සිඳුණ දෙපා ඔහුගේ තනිකම හා හුදෙකලාවත් අසරණ බවත් මතු කර ලන සේ සම්බන්ධ කොට ගන්නා කවියා බැල්ලගේ දිවේ සිසිලෙන් දෙපා තෙත් වෙද්දී ඇතුළතින් වට වැස්ස නමැති අනුකම්පාව, දයාව, පිළිසරණ යන හැඟීම් නමැති වැස්සෙන් මහල්ලාගේ දෙනෙත් තෙත් වූ බව පවසයි. කවියකු තුළ තිබිය යුතු නිර්මාණ හැකියාව මැනවින් කියා පාන මෙම රචනාවෙහිදී මෙලොව ජීවත් වන මිනිසුන්ගේ පමණක් නොව සතුන් සිවුපාවුන්ගේ පවා හුදෙකලාව, පාළුව, තනිකම සමග ඔවුන් ඉල්ලා සිටින ආදරය, සෙනෙහස හා අනුකම්පාව පිළිබඳව ද අරුත් බර අදහස් සමූහයක් කාව්‍යාත්මක ලෙස ඉදිරිපත් කර ඇත. මෙලොව ජීවත් වන මිනිසුන් හා ගැහැනුන් මතු නොව තිරිසන් සතුන් ද සාමූහිකත්වය අපේක්ෂා කරන බව ජීවිතය ගැන මෙනෙහි කරන විට අපට අවබෝධ වෙයි. හුදෙකලාව මිනිසා වේදනාවෙන් පරිපීඩිත තත්වයකට පත් කරන ආකාරය මෙහි දැක්වූ නිර්මාණ කරුවන් හැරුණ විට වෙනත් බොහෝ ලේඛකයන්ගේ නිර්මාණවලට ද විෂය වී ඇත.

MONT ALBERT DENTISTS P/L
For all Your Dental Requirements
We Provide
GENERAL DENTAL TREATMENT
COSMETIC DENTAL
TEETH WHITENING
PARTIAL/FULL DENTURES
EMERGENCY SERVICES
WE ACCEPT COMMUNITY DENTAL VOUCHERS, TEEN VOUCHERS, ALL PRIVATE HEALTH INSURANCES AND MEDICARE VOUCHERS FOR APPROVED PATIENTS.
FOR APPOINTMENTS
9890 3609
DISCOUNTS FOR FAMILIES, FREE CHECK UPS FOR KIDS UNDER 7 YEARS
DR. ENOKA JAYATILAKEBANDA (BDS)
MONT ALBERT DENTISTS
2A CHURCHILL ST
MONT ALBERT VIC 3127
(CLOSE TO BOX HILL CENTRAL)
www.montalbertdentists.com.au

IMMIGRATION LAW @
Australian Immigration Law firm of the Sri Lankan Community
We are proud to have lead the way for others to follow...
Professional Immigration Legal Services
Legal Advice in simple to complex Immigration matters
- Skill Assessments
- State Sponsorships Expression of Interest (EOI)
- Visa Lodgments
- Employer Sponsorships & Nominations
- Migration Review Tribunal Appeals
- Federal Court Appeals
- Ministerial Appeals
General Skill Migration
457 Visas
Employer Nominated Migration
Student Visas
Graduate Skill Visas
Permanent Residence Pathways
Spouse Visas
Contributory Parent Visas
Business Migration
Resident Return Visas
A Team of Qualified & Experienced Lawyers & Registered Migration Agents



Susantha Katugampala
Principal
Barrister & Solicitor
Accredited Immigration Law Specialist
MARN: 9601070
LAW INSTITUTE OF VICTORIA ACCREDITED SPECIALIST
FAIRFIELDS LAWYERS
AUSTRALIA GATEWAY
Australian Immigration Law Advisory
10 Morrison Place
East Melbourne 3002
Australia
T: 03 9650 4557
1300 888 331
M: 0417 851 041
Suite 602, Hilton Colombo
Residence 200
Union Place, Colombo 2
Sri Lanka
T: +94 11 2300 627
M:+94 777 347 670
info@fairfieldslawyers.com



We Deliver Results...